දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/07/New/174/Graduate Rac./ 2025
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2025.10. 27
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு

# Ministry of Health& Mass Media

---

හෙද උපාධිධාරී අයදුම්කරුවන් වෙත

**අංක 2446 හා 2025.07.18 දිනැති ගැසට් නිවේදනයට අනුව හෙද උපාධිධාරීන් හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුව සඳහා බඳවා ගැනීම**

උක්ත ගැසට් නිවේදනය ප්‍රකාරව අයදුම්පත් ඉදිරිපත් කරන ලද හෙද උපාධිධාරීන් අතරින් 2025.09.13,14 දිනවල දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මගින් හෙද අනුස්ථාපන හා සමයෝජන පුහුණුව සඳහා බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති හෙද උපාධිධාරීන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය සහ ඔවුන්ගේ **GPA** අගය අනුව සකස් කරන ලද නාම ලේඛනය මේ සමඟ ඇමුණුම 01 මගින් දක්වා ඇත.

02. ඒ අනුව, එම ලැයිස්තුවේ සඳහන් සුදුසුකම්ලාභීන් පුහුණුවට බඳවා ගැනීම සඳහා වන පත්වීම් ලිපි ප්‍රධානය වෙනුවෙන් සංකේතාත්මක පත්වීම් ප්‍රධානෝත්සවයක් ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා ජාතික රෝහලේ බාහිර රෝගී අංශ ශ්‍රවණාගාරයේ දී පස්වරු 02.00 ට පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

03. ඒ සඳහා ඇමුණුම 01 මගින් දක්වා ඇති ලැයිස්තුවේ 1 සිට 200 දක්වා නම් සඳහන් හෙද උපාධිධාරීන් 2025.10.31 දින ප.ව.12.30 ට ශ්‍රී ලංකා ජාතික රෝහලේ බාහිර රෝගී අංශ ශ්‍රවණාගාරය වෙත පැමිණිය යුතු බව දැනුම්දෙමි. එදිනට පැමිණීමේ දී ඔබ, ඔබට අදාළ හෙද නිල ඇඳුමින් සැරසී පැමිණිය යුතු අතර ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය සහතික කළ හැකි ලියවිල්ලක් අනිවාර්යයයෙන් රැගෙන ආයුතු වේ.

04. එසේම, සෙසු හෙද උපාධිධාරීන් සඳහා 2025.11.01 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී පත්වීම් ලිපි ලබා දීමට නියමිත බැවින්, උක්ත ඇමුණුම 01 හි අනු අංක 201 සිට 689 දක්වා නම් සඳහන් හෙද උපාධිධාරීන් 2025.11.01 දින පෙ.ව.9.00 සිට අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය වෙත පැමිණ අදාළ පත්වීම් ලිපි ලබාගැනීමට කටයුතු කරන මෙන් ද දන්වා සිටිමි.

චාමික එච්. ගමගේ
අතිරේක ලේකම් (පාලන) II
ලේකම් වෙනුවට

චාමික එච්. ගමගේ
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

tamilguru.lk